# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1750/1 - 2012 මාර්තු 19 වැනි සඳුදා - 2012.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි 05 වැනි දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ 1972 මැයි 05 වැනි දින දරන සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ නිවේදනය.

### නිවේදනය

කලින් කළ සංශෝධිත 1934.02.05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 වගන්තියට ඉනික්බිතිව පහත දැක්වෙන පරිදි අතුරු වගන්ති ඇතුළත් කිරීමෙන් එම ව්‍යවස්ථා සංග්‍රහය වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

01. විශ්‍රාමික රජයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත හෝ සේවා අවශ්‍යතා මත නැවත සේවයේ යොදවා විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේදී ඔවුන්ට පෙර ගෙවන ලද සම්පූර්ණ පාරිතෝෂිකය ඔවුන්ගේ නව ප්‍රදානයෙන් අයකළ යුතු ය.

02. ඉහත සඳහන් කරුණු හැරුණු කොට විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සංශෝධනය වී, විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල සංශෝධනය වන වෙනත් අවස්ථාවන්හිද පෙර ගෙවන ලද පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම නව පාරිතෝෂික මුදලින් අයකළ යුතුය.

03. මෙම විධිවිධාන සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා ද අදාළ වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

04-5/1

1A - G 15789 — 1345 (2012/03)
*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1749/1 සාණ්ඩය අංක 1749/29 න් අවසන් වේ.*

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි 05 වැනි දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සහ 1972 මැයි 05 වැනි දින දරන සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ නිවේදනය.

## නිවේදනය

කලින් කළ සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 වගන්තියට ඉනික්බිතිව පහත දැක්වෙන පරිදි අතුරු වගන්ති ඇතුළත් කිරීමෙන් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සහ එහි අනුෂාංගික පනත් හා රෙගුලාසි යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම් ලබන පළාත් පාලන සේවකයන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබෙන විට, එකී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ බලපැවැත්වෙන විධිවිධාන ඒ ආකාරයට ඔවුන්ට ද බලපවත්වන්නේය.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

04-5/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.